# 10 දෙවන බස සිංහල

ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2015 වසරේ සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

Web: www.nie.lk
Email: info@nie.lk

# දෙවන බස

# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

(2015 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

දෙවන බස
සිංහල

10 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN :.....................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

මුද්‍රණය :

වෙබ් අඩවිය : w.w.w.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂය මාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

විෂය සම්බන්ධීකරණය : එම්. ජී. මුණසිංහ මහතා - කථිකාචාර්ය

විෂය කමිටුව :

මහාචාර්ය රත්න විජේතුංග මහතා (විශ්‍රාමික) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාර්ය තිස්ස ජයවර්ධන මහතා (විශ්‍රාමික) - කොළඹ විශ්ව විද්‍යාලය
පේමසිරි සුබසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ
ර්. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා - කථිකාචාර්ය
කේ. ඤාණවිමල හිමි - කථිකාචාර්ය
එම්. ජී. මුණසිංහ මහතා - කථිකාචාර්ය
තිලිනි රත්නායක මහත්මිය - කථිකාචාර්ය
මංගල ගුණරත්න මහතා - සහකාර කථිකාචාර්ය
පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය - සහකාර කථිකාචාර්ය
පී. වී. සෙල්වරාජ් මහතා - කථිකාචාර්ය, (විශ්‍රාමික)
එච්. එල්. හරිස්චන්ද්‍ර මහතා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
සුජාතා උපසේන මහත්මිය - ගුරු උපදේශක
අනීෂා ඉනාම් ඕෂන් මහත්මිය - ගුරු උපදේශක
ඒ. එච්. ෆාතිමා බීබි මහත්මිය - ගුරු උපදේශක
ධම්මිකා කරල්ලියද්ද මෙනවිය - ගුරු සේවය
තේජා ඇරැගොඩ මහත්මිය - ගුරු සේවය
එම්. එච්. ඒ. සජීවනී මහත්මිය - ගුරු සේවය

ලේඛක මණ්ඩලය :

අභ්‍යන්තර :
ර්. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
කේ. ඤාණවිමල හිමි - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
එම්. ජී. මුණසිංහ මහතා - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
තිලිනි රත්නායක මහත්මිය - කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
මංගල ගුණරත්න මහතා - සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය - සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

බාහිර ඃ

| | | |
|---|---|---|
| ආර්. ඒ. සුනීකා මහත්මිය | - | නියෝජ්‍ය කොමසාරිස් (විශ්‍රාමික) |
| පී. වී. සෙල්වරාජ් මහතා | - | විද්‍යාපීඨ කථිකාචාර්ය, (විශ්‍රාමික) |
| එච්. එල්. හරිස්චන්ද්‍ර මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| ආර්. එම්. ජේ. ඩී. කුමාර මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| ධම්මිකා කරල්ලියද්ද මෙනවිය | - | ගුරු සේවය |

භාෂා සංස්කරණය ඃ සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

විවිධ සහාය ඃ

අනුලා නන්දනී රාජපක්ෂ මහත්මිය
චාමිනි මානවඩු මහත්මිය
නිලූපා අබේරත්න මහත්මිය
උපාලි ජයලත් මහතා

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ගුරු මාර්ගෝපදේශය ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාව වැඩි කිරීම සඳහා මග පෙන් වනු ලබයි. ගුරුවරයාට වඩාත් පහසුවෙන් නිපුණතාවත්, නිපුණතා මට්ටමටත්, ඊට අදාළ පාඩමත් හඳුනා ගෙන ඉගැන්වීම් කාර්යයයේ නියැලීමට ඉඩ සැලසේ. ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද, උපකරණ අමතර ක්‍රියාකාරකම් මෙහි අන්තර්ගත ව ඇත.

විශේෂයෙන් ම සවන් දීම, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය මූලික වශයෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී භාෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් භාෂා හැකියා පුළුල් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.

:

මෙහි මූලික වදන් මගින් පෙළ පොතේ පාඩමට අදාළ වාක් කෝෂය පෝෂණය කිරීමට වැඩි අවකාශයක් ලබා දී ඇත. ඒ සඳහා දරුවන්ගේ භාෂණ හැකියාව සංවර්ධනය කිරීමට පුහුණුව සඳහා යොදා ගත යුතු භාෂණ රටා ඇතුළත් කර තිබේ. ඒවා හැකිතාක් භාවිත කරමින් පන්ති කාමරයේ දී ශිෂ්‍යයන් කතා කරවීමට පෙලඹ විය යුතු ය. ඊට අදාළ ක්‍රියාකාරකම්හි වැඩි වැඩියෙන් නිරත කරවීම සඳහා ඔබගේ අත්දැකීම් ද පාදක කර ගනිමින් පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන අයුරින් මෙම ක්‍රමවේද තවත් සරල කර ගනිමින් අවශ්‍ය අවස්ථාවල දී සංයුක්ත තැටි, හඬ පට, ගීත, ඡායාරූප, පින්තූර ආදි වඩාත් උචිත ක්‍රමවේද යොදා ගත හැකි ය. එසේ ම පාඩම් සැලසුම් සඳහා ලබා දී ඇති උපදෙස් ද සැලකිල්ලට ගෙන වඩාත් ආකර්ෂණීය ලෙස පාඩම් සැලසුම් කිරීමට ගුරුවරයාට අවස්ථාව සැලසෙනු ඇත.

මෙහි ඇති වඩාත් සුවිශේෂ කරුණ වන්නේ අදාළ පාඩම අවසානයේ ශිෂ්‍යයා අත් පත් කර ගත යුතු දේ ඉගෙනුම් පල ලෙස දක්වා තිබීමයි. එම කුසලතා ශිෂ්‍යයන්ගෙන් මතු කර ගැනීමට නිරතුරුව ම ඔබ වගබලා ගත යුතු ය. ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති නිර්ණායක මගින් ශිෂ්‍යයන්ගේ ප්‍රබලතා හා දුබලතා හඳුනා ගෙන ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට හැකියාව ලැබේ. මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කරමින් ඔබේ අත්දැකීම ද ඒ සඳහා සුදුසු පරිදි යොදා ගෙන පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මෙය මහෝපකාරී වනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමු.

ලේඛක මණ්ඩලය

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v- vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| හැඳින්වීම | ix |
| ජාතික අරමුණු | x-xi |
| මූලික නිපුණතා | xii-xiii |
| විෂයයේ අරමුණු | xiv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xv - xxv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |
| 1. සවන්දීම | 2 - 11 |
| 2. කථනය | 12 - 25 |
| 3. කියවීම හා නැරඹීම | 26 - 35 |
| 4. ලිවීම | 36 - 45 |

# හැඳින්වීම

සමාජය නොකැඩී නොබිඳී පවතින්නේ පුද්ගලයන් අතර පවතින හොඳහිත සහ සුහදතාව නිසා ය. එබැවින් සමාජය නොකැඩෙන සේ නොබිඳෙන සේ පවත්වා ගැනීමේ අරමුණ සාමාජිකයන් අතර දැඩි ලෙස පැවතිය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට මූලාධාර වන්නේ මනුෂ්‍යයා සමාජගත වීම සඳහා යොදා ගන්නා ප්‍රබලතම උපකරණය වන භාෂාව යි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රාථමික අවධියේ සිට සිංහල/දමිළ භාෂා දෙකින් එක් භාෂාවක් දෙවන බස ලෙස හැදෑරීම අනිවාර්ය ව පවතී. තම අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම මගින් සාධනීය ආකල්ප ගොඩනගා ගැනීමට මෙහි දී අවස්ථාව උදා කර දී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් භාෂාවක් භාවිත කිරීමට පුද්ගලයා සතු දෙයාකාර භාෂා ශක්‍යතා අතරින් භාෂණ ශක්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දෙවන බස සිංහල විෂයමාලාව සැලසුම් කොට ඇත.

මේ සම්බන්ධයෙන් පසුගිය විෂයමාලා ප්‍රතිසංස්කරණ හා ඒ අනුසාරයෙන් සැකසුණු පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණයන් ද ලොව විවිධ රටවල භාවිත කෙරෙන බොහොමයක් විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන්නට යෙදුණි. එහි දී නොයෙක් පාර්ශවයන්ගේ අවධානයට බඳුන් වූ "**පොදු යුරෝපියානු ආදර්ශනය**" (The Common European Framework of Reference for Languages (CEFR) කෙරෙහි සැලකිල්ල යොමු විය. **එහි හරය සහ ආකෘතික රාමුව** ගැන විශේෂ යොමු වීමක් සිදු විය. එහි දී දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට උදව් වන ලෙස හෙළ බසේ ගති සොබා හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දක්වමින් දෙවන බස සිංහල විෂයමාලාව සකසා ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක් වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම. |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකුල ඉලක්කම් භාවිතය. |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම. |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම. |

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්,අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්. |

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂයයේ අරමුණු

1. ශබ්ද උච්චාරණ රටා
   ශබ්ද උච්චාරණ රටා, ශ්‍රවණ අත්දැකීම් සහ භාෂා රටා අනුකරණාත්මක ව හැසිරවීමේ හුරුව ඇති කර ගැනීම.

2. ශ්‍රවණ සංයමය හා අවධානය
   විවිධතා හඳුනා ගනිමින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ඇති කර ගැනීම.

3. ස්මරණය
   මතකය අවධි කර ගනිමින් අලුත් යමක් නිපදවීමේ ශක්තීන් ගොඩනගා ගැනීම.

4. වින්දනය හා සුහදතාව
   අසා රස විඳිමින් ප්‍රසන්න සහ සුන්දර සිතිවිලි මඟින් මානව දයාව, සුහදතාව ගොඩනැගීම.

5. භාවිත රටා හුරුව
   භාෂා රීතිවලට අනුගත ව භාෂාව භාවිත කිරීමේ හුරුව සහ සිංහල අත් අකුරු නිවැරදි ව, ක්‍රමවත් ව, පැහැදිලි ව ලිවීමේ හුරුව ඇති කර ගැනීම.

6. වාක්කෝෂ හැකියාව
   බස්වහර හඳුනා ගනිමින් අන්තර්ගත වචන රැස් කරමින් ඒවා සුදුසු ලෙස භාවිත කිරීමේ හුරුව ඇති කර ගැනීම.

7. ආකල්ප ගොඩනැගීම
   උත්සව අවස්ථා, සිරිත් විරිත්, පරිභෝජන රටා, ගණන් මිනුම් පිළිබඳ හෙළබසේ ගති සොබා අනුව සිංහල සංස්කෘතියෙහි හැඩරුව හඳුනා ගනිමින් සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දායක වීම.

8. විෂය නිර්දේශයේ අරමුණු
   - විවිධ ප්‍රායෝගික කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාෂා සම්මතයන්ට (රීති) අනුව භාෂා භාවිතය පිළිබඳ ව හුරුව ලබා ගැනීම.
   - සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම සඳහා යහපත් ආකල්ප හා පුරුදු සංවර්ධනය කර ගැනීම.
   - පුරවැසියෙකු ලෙස සියලු ප්‍රතිලාභ අත්විඳීම උදෙසා දේශීය වශයෙන් වෘත්තීය ප්‍රස්තාවන් සඵල කර ගැනීම සඳහා භාෂා ප්‍රවීණතාවක් ඇති කර ගැනීම.

සවන් දීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0<br>එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස්වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට (Texts) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි. | 1.1<br>සුහද කතා බහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • ක්‍රීඩා සමාජය<br>• මිතුරු සමාජය,<br>• යෞවන සමාජයක් | • අලුත් වචන හඳුනා ගෙන භාවිත කරයි.<br>• අදාළ වචන ප්‍රායෝගික ව භාවිත කරයි.<br>• අවස්ථාවට අදාළ ව නිවැරදි ව ප්‍රතිචාර දක්වයි. | 05 |
| | 1.2<br>උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • වෛද්‍යවරයෙකුගෙන් ලැබෙන උපදෙස් | • දෙනු ලබන උපදෙස්වලට ක්‍රියාකාරී ව ප්‍රතිචාර දක්වයි.<br>• අන්තර්ගතයේ ඇති අලුත් වචන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• වෙනත් උපදෙස් සවන් දීමට/කැමැත්ත ප්‍රකාශ කරයි. | 04 |

| සවන්දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.3<br>යමක් පිළිබඳ විමසීම්වලට හා මඟ විමසීම්වලට සවන් දෙයි ප්‍රතිචාර දක්වයි. | • නගර ශාලාවේ දෙවන මහලේ ශාලා අංක 2 හි පැවැත්වෙන චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීම සඳහා දුරකථනයෙන් විමසීම. | • මග විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br>• මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අදාළ වචන භාවිත කරමින් මග විමසීම් කරයි.<br>• මග විමසීම් සඳහා අවශ්‍ය වන වෙනත් වචන ඉගෙනුමට කැමැත්ත ප්‍රකාශ කරයි. | 05 |
| | 1.4<br>නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • ගුරු උපහාර උලෙළ සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කර ගැනීමට පැමිණෙන ලෙස කෙරෙන නිවේදනයක් | • දෙන ලද නිවේදනය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නිවේදනයක තිබෙන මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>• සරල නිවේදනයක් අසා ලියයි.<br>• විවිධ නිවේදන සවන් දීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | 04 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.5<br>ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවලට සවන් දී රස විඳියි. | • මව්ගුණ කිය වෙන ගීතයක් | • අදාළ ගීතයේ අදහස සරල බසින් ප්‍රකාශ කරයි.<br>• ගීතයට උචිත අයුරින් තාල තබයි.<br>• ගීතය ගායනා කරයි. (සාමූහික ව/තනි තනි ව)<br>• වෙනත් ගීත ඇසීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | 04 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 2'0<br>පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි. | 2.1<br>උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙය්ඃ | • පාසලේ නිවාසාන්තර උත්සවයක දී නිවාසයක් ගොඩනැංවීම. | • උපදෙස් ලබා දීමේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• දෙන ලද උපදෙස්වලට අනුව කටයුතු කරයි.<br>• උපදෙස්වලට අනුව වාචික ප්‍රතිචාර දක්වයි. | 05 |
| | 2.2<br>මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි. | • ෆාමසියක් සොයා ගැනීමට විමසා සිටීමක් | • මග විමසීම්වල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• එම වචන භාවිත කරමින් මග විමසීම් සිදු කරයි.<br>• මග විමසීම් සඳහා මැදිහත් වී කටයුතු කරයි.<br>• මග විමසුම්වලට අදාළ ව නිවැරදි ප්‍රතිචාර දක්වයි. | 05 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.3<br>සුහද සංවාදවල දී මැදිහත් වෙයි. | • සුහද කතා බහක් කලින් හඳුනන මිතුරෙකු හමුවීම. | • සුහද සංවාදයක දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• එම වචන භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි.<br>• අවස්ථානුකූල ව සංවාදවලට මැදිහත් වෙයි.<br>• සරල සුහද සංවාදවල යෙදෙයි. | 05 |
| | 2.4<br>තොරතුරු හුවමාරු කර ගැනීමේ දී මැදිහත් වෙයි. | • වැසි වසින දවසක ළමයින් අතර ඇති වන කතාබහක් | • අවස්ථානුකූල ව තොරතුරු හුවමාරුවේ දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• එම වචන භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි.<br>• තොරතුරු විමසමින් මැදිහත් වෙමින් එකඟතාවකින් කටයුතු කරයි.<br>• විවිධ අවස්ථාවල දී තොරතුරු හුවමාරු කර ගනියි. | 05 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.5<br>ගනුදෙනුවල දී මැදිහත් වෙයි. | • ප්‍රදර්ශනයක් නැරඹීමට යාමට ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම. | • ගනුදෙනුවල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• එම වචන භාවිත කරමින් ගනුදෙනුවල යෙදෙයි.<br>• විවිධ ගනුදෙනු සිදු කරයි.<br>• විවිධ ගනුදෙනුවල දී සුහද ව අදහස් ප්‍රකාශ කිරීමට මැදිහත් වෙයි. | 05 |
| | 2.6<br>සාකච්ඡාවල දී මැදිහත් වෙයි. | • නිවේදන කටයුතු කිරීම සඳහා ශිෂ්‍යයෙක් තෝරා ගත් අවස්ථාවක් | • සාකච්ඡාවල දී උචිත වචන යොදමින් කතා කරයි.<br>• අන්‍යයන්ගේ මත ඉවසමින් සාකච්ඡාවට මැදිහත් වෙයි.<br>• තම අදහස් සරල ව ප්‍රකාශ කරයි.<br>• විවිධ සාකච්ඡාවලට අවස්ථානුකූල ව සහභාගි වෙයි. | 04 |

| කථනය - ඉදිරිපත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.7<br>වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි. | • භාෂා ඉගෙනීමේ වැදගත්කම සහ පාඨමාලාවක් හැදෑරීමේ දී අත්වන වාසි සසඳා බලා වඩාත් සුදුසු දේ තෝරා ගැනීම. | • වාචික ඉදිරිපත් කිරීම්වල ස්වභාවය හඳුනා ගෙන අනුගමනය කරයි.<br>• වාචික ඉදිරිපත් කිරීම් කරයි.<br>• ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් වාචික ඉදිරිපත් කිරීම් කරයි.<br>• විවිධ උපකරණ/ආධාරක භාවිත කරමින් වාචික ඉදිරිපත් කිරීම් කරයි. | |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 3.0<br>එදිනෙදා පොදු සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Texts) අවබෝධයෙන් කියවා m%;spdr olajïka ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි. | 3.1<br>ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි. | • යහළුවකුගෙන් ලැබුණු ලිපියක් | • ලිපියක් නිශ්ශබ්ද ව කියවයි.<br>• එම ලිපියේ ඇතුළත් තොරතුරු කියයි.<br>• වෙනත් ලිපි ලේඛන කියවයි නරඹයි.<br>• ඒවායේ සරල අදහස් ප්‍රකාශ කරයි. | 04 |
| | 3.2<br>සාහිත්‍යමය පාඨ කියවයි. නරඹයි. | • ජන කතාවක් හෝ ගීතයකa | • ගීතයට අනුව තාල තබයි.<br>• ගීතය ගායනා කරයි.<br>• පින්තූර නරඹමින් ගීතයේ සරල අර්ථය ප්‍රකාශ කරයි.<br>• ගීතය තාලානුකූල ව ගායනා කරයි. | 04 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.3<br>උපදෙස් කියවයි. නරඹයි. | • චාරිකාවක් යන අතර තුර භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කිරීම. | • උපදෙස්වල ඇතුළත් වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• වෙනත් සරල උපදෙස් කියවයි.<br>• උපදෙස් අනුව කටයුතු කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී විවිධ අවස්ථාවල භාවිත උපදෙස් කියවයි/නරඹයි. | 05 |
| | 3.4<br>ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ (Audio Visual Texts) හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි. | • පින්තූර කතාවක් (වළහා කී රහස) | • ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි.<br>• පින්තූර කතාවක එක් එක් අවස්ථාවල දැක්වෙන විස්තරය කියවයි/නරඹයි.<br>• සරල කතාවක් පිළිවෙළින් ගොඩ නගා කියවයි.<br>• රසවත් කෙටි සිද්ධි ඇතුළත් කතා කියවයි. | 04 |

,sùu

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 4'0<br>පොදු, සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි. | 4.1<br>විස්තර පාඨ ලියය්s | • අකුරු කියවීමේ අවස්ථාවක් | • මාතෘකාවක් යටතේ කෙටි වාක්‍ය කිහිපයක් ලියයි.<br>• වාක්‍ය ලිවීමේ දී විවිධ පද රටා අනුව වාක්‍ය ලියයි.<br>• තම අත්දැකීමක් සරල බසින් ලියයි. | 05 |
| | 4.2<br>නිර්මාණාත්මක පාඨ ලියයි. | • තාත්තාට රැකියා ස්ථානයේ මාරුවක් ලැබී අලුත් පාසලකට යාමට සිදුවීම. | • සිදුවීමක් ඇසුරින් නිර්මාණාත්මක වාක්‍ය කිහිපයක් ලියයි.<br>• තම අත්දැකීමක් නිර්මාණාත්මක ව ලියයි.<br>• කාල්පනික අවස්ථාවක් මාතෘකා කර ගනිමින් නිර්මාණාත්මක පාඨ ලියයි. | 03 |

| ,sùu | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 4.3<br>ලිපි ලියයි. | • පාසල් සිසුවෙකු භාෂා පාඨමාලා පවත් වන ආයතනයකින් දෙවන බස සිංහල පාඨමාලාවක් කිරීමට අවස්ථාව ඉල්ලා යවන ලිපියක් | • වෙනස්කම් සහිත විධිමත් හා අවිධිමත් සරල ලිපි ලියයි.<br>• විධිමත් ලිපි ලිවීමට හුරු වෙයි.<br>• තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලිපි ලියයි.<br>• රාජකාරිමය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ලිපි ලියයි. | 04 |
| | 4.4<br>තොරතුරු සහිත පාඨ ලියයි. | • සුන්දර දිය ඇලි පිළිබඳ සරල විස්තරක් | • තොරතුරු ඇතුළත් පාඨ හඳුනා ගෙන ලියයි.<br>• සරල මාතෘකා යටතේ තොරතුරු ඇතුළත් පාඨ ලියයි.<br>• සිත් ගත් අවස්ථාවක් පිළිබඳ තොරතුරු පාඨ ලියයි.<br>• පුවත් පතකට ලිපියක් ලියයි. | 03 |

lshùu yd kerõu

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 4.5<br>ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ලියයි. | • පාඨමාලාවක් හැදෑරීම සඳහා අයදුම්පත්‍රයක් පිරවීම. | • අයදුම්පතට අදාළ ව තොරතුරු කෙටියෙන් ඉදිරිපත් කරයි.<br>• අයදුම්පතක් පුරවයි.<br>• පාඨමාලාවක් හැදෑරීම/ රැකියාවක් සඳහා අයදුම් පත්‍රයක් සම්පූර්ණ කරයි. | 04 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- සවන්දීම
- කථනය
- කියවීම හා නැරඹීම
- ලිවීම

## සවන් දීම

නිපුණතාව 0.1 : එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට (Text) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 1.1 : සුහද කතාබහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- අලුත් වචන හඳුනා ගෙන භාවිත කරයි.
- සුහද කතා බහේ යෙදෙයි.
- අවස්ථාවට අදාළ ව නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම කියවා ආදර්ශනය කරන්න.
- සකස් කර ගත් හඬ පටයක් භාවිත කරමින් ද සවන් දීමට අවස්ථාව උදා කර ගන්න.
- කිහිප වරක් සවන් දීමට සලස්වන්න.
- මූලික වදන්වල ඇතුළත් වචන හා භාෂා රටා කෙරෙහි අවධානය යොමු කරවන්න.
- පාඩමෙහි ඇතුළත් සුහද කතාබහ ශිෂ්‍යයන් යොදා ගෙන සජීවී ව ඉදිරිපත් කිරීමට
  අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍යයන් සියලු දෙනාගේ සහභාගිත්වය ඒ සඳහා ලබා ගන්න.
- වගන්ති හා භාෂා රටා හඳුනා ගෙන ප්‍රතිචාර දැක්වීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- ශිෂ්‍යයන් පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් :

- ක්‍රීඩා සමාජයක් පිහිටුවා ගැනිමට කරන සාකච්ඡාවක්

| | |
|---|---|
| රැස්වුණේ | කියද්දි |
| යෝජනා | ග්‍රාම නිලධාරි |
| කියන්නකො | ලබන සතියෙ සෙනසුරාදා |
| දැනුම් දෙන්න ඕන. | මෙතන දී |
| කියන්න වෙන්නේ නෑ. | සවස |
| කියන්නේ කවදා ද? | |
| කියමු | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

යන්නකො.
කන්නකො.
කියන්නකො.
බලන්නකො.

යන්න ඕන.
කන්න ඕන.
කියන්න ඕන.
කන්න ඕන.
බලන්න ඕන.
කරන්න ඕන.

යන්න ඕන නෑ.
කන්න ඕන නෑ.

ගුණාත්මක යෙදවුම් :

- පෙළ පොත
- සුහද කතාබහක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක්
- පෙළ පොතේ පාඩමේ දෙබස් කියවීම සඳහා කලින් සූදානම් කරගත් ළමයින් පිරිසක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- මූලික වදන්වල ඇති වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සරල වචන භාවිත කරමින් අන් අය සමග අදහස් හුවමාරු කර ගනියි.
- වෙනත් සාකච්ඡාවලට සහභාගි වීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

නිපුණතාව 1.0 : එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 1.2 : උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

කාලච්ඡේද : 04යි

ඉගෙනුම් පල :

- දෙනු ලබන උපදෙස්වලට ක්‍රියාකාරී ව ප්‍රතිචාර දක්වයි.
- අන්තර්ගතයේ ඇති අලුත් වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- වෙනත් උපදෙස් සවන් දීමට/කැමැත්ත ප්‍රකාශ කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම සවන් දීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ට වැඩි වාර ගණනක් ඇසීමට සලස්වන්න.
- සරල උපදෙස්වලට සවන් දී අදහස මතුකර ගැනීමට උදව් වන්න.
- තනි තනි ව හෝ සාමූහික ව හෝ ක්‍රියාකාරකම්හි යොදවන්න.
- පාඩමේ ඇතුළත් සරල උපදෙස් ශිෂ්‍යාන්ට අවබෝධ වන ලෙස ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- ශිෂ්‍යයන් පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් :

- වෛද්‍යවරයෙකුගෙන් ලැබෙන උපදෙස්

| | |
|---|---|
| පොඩි කරන්න එපා. | වැදිලා |
| පැත්ත බලන්න. | රතු වෙලා. |
| පරෙස්සම් කර ගන්න. | ගලනවා |
| එහෙ මෙහෙ දුවන්න එපා. | මොකද? |
| | මොකක්ද? |
| | නිතර නිතර |
| | දෙපාරක් |
| | ගන්න |
| | දාන්න |

- පුහුණුව සඳහා යොදා ගන්න.

ඒ පැත්ත බලන්න.
මේ පැත්ත බලන්න.
අර පැත්ත බලන්න.

අල්ලන්න එපා.
කන්න එපා.
පනින්න එපා.
බොන්න එපා.
නටන්න එපා.
දුවන්න එපා.

ගුණාත්මක යෙදවුම් :

- රංගන ජවනිකාවක්
- ශ්‍රව්‍ය පටයක්
- පෙළ පොත

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- උපදෙස් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට අදාළ වාචික ප්‍රතිචාර දක්වයි.
- උපදෙස් අනුව කටයුතු කරයි.
- උපදෙස් පිළිපැදිය යුතු බව පිළිගනියි.

නිපුණතාව 1.0 : එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 1.3 : මග විමසීම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- මග විමසීම් අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදාළ වචන භාවිත කරමින් මග විමසීම් කරයි.
- මග විමසීම් සඳහා අවශ්‍ය වන වෙනත් වචන ඉගෙනුමට යෝජනා කරයි./ කැමැත්ත ප්‍රකාශ කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ට කිහිපවරක් සවන් දීමට සලස්වන්න.
- මග විමසුම් අවස්ථාවක දී යොදා ගන්නා භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරන්න.
- ශිෂ්‍යයන් එම භාෂා භාවිතයන් හුරුකර වීමේ ක්‍රියාකාරකමක යොදවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- ශිෂ්‍යයන් පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් :

- චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා දුරකථනයෙන් විමසීම්

| | |
|---|---|
| ආයුබෝවන්! ආයුබෝවන්! | කොහොමද ප්‍රවේශ පත්‍ර ගන්නේ? |
| සුබ දවසක් | කවදා ද ප්‍රදර්ශනය පටන් ගන්නේ? |
| කවුද කතා කරන්නේ? | කොහේද තිබෙන්නේ? |
| අපි කළු අග්ගලින් | ප්‍රවේශ පත්‍රයක් කීය ද? |
| ඔබට මොකක්ද අවශ්‍ය? | ඇරලා තියෙනවා |
| තියෙන්නේ කවදා ද? | මොනව ද? |
| අපට ප්‍රවේශ පත්‍ර ලබා ගන්න ඕනෑ. | පුළුවන් ද? |

- පුහුණුව සඳහා යොදා ගන්න.

කවදා ද? කොහෙ ද?

කොහොම ද? කොතන ද?

මොකක් ද?

පුළුවන් ද?

කීය ද?

ඇරලා තියෙනවා.

වහලා තියෙනවා.

ඉඳලා තියෙනවා.

යවලා තියෙනවා.

ගුණාත්මක යෙදවුම් :

- දුරකථන සංවාදයක් ඇතුළත් පත්‍රිකා
- ශ්‍රව්‍ය පටයක්
- පෙළ පොතේ අදාළ පාඩම

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම් සඳහා එම වචන අවශ්‍ය බව පිළිගෙන ප්‍රකාශ කරයි.
- එම වචන භාවිත කරමින් එකිනෙකාගෙන් විමසීම් කරයි.

නිපුණතාව 1.0 : එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 1.4 : නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

කාලච්ඡේද : 04යි

ඉගෙනුම් පල :

- දෙන ලද නිවේදනය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිවේදනවල භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිවේදනයක තිබෙන මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- විවිධ නිවේදන සවන් දීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතාවට අදාළ ව සකසා ඇති පෙළ පොතෙහි පාඩම පරිශීලනය කරන්න.
- පාඩමෙහි ඇතුළත් නිවේදනය හඬ පටයක මාර්ගයෙන් හෝ වෙනත් ක්‍රමයක් මගින් හෝ ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- එම පාඩම ශිෂ්‍යයන්ට වැඩි වාර ගණනක් ඇසීමට අවස්ථාව ලබා දෙන්න.
- නිවේදනයක ස්වභාවය හඳුනා ගනිමින් ඉන් කියැවෙන ප්‍රධාන අදහස තේරුම් ගැනීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- ශිෂ්‍යයන් පාඩමෙහි ඇතුළත් ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් :

- ගුරු උපහාර උලෙළක නිවේදනයක්

| | |
|---|---|
| නිවේදනය | පස්වරු 2.00 ට |
| සිට | සංවිධායක කමිටුව |
| දක්වා | දන් වනු ලැබේ. |
| ශිෂ්‍ය නායක නායිකාවන්ටයි. | සාකච්ඡාවක් |
| වාර්ෂික ව පවත්වනු ලබන | සාකච්ඡාවට |
| ප්‍රධාන ශාලාවේ දී පැවැත්වෙන | උපහාර උලෙළ |
| ආරාධනා කරනු ලැබේ. | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

| | |
|---|---|
| දිනපතා පවත්වනු ලැබේ. | ක්‍රීඩා උලෙළ |
| සතිපතා පවත්වනු ලැබේ. | කලා උලෙළ |
| වාර්ෂික ව පවත්වනු ලැබේ. | උපහාර උලෙළ |

ගුණාත්මක යෙදවුම් :

- නිවේදනය ඇතුළත් ශ්‍රව්‍ය පටයක්
- ශිෂ්‍යයෙකු ලවා කෙරෙන නිවේදනයක්
- පුවත්පත්වල පළ වූ සරල නිවේදන

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- නිවේදනයේ සරල අදහස ප්‍රකාශ කරයි.
- නිවේදනයේ භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- නිවේදන කටයුතු කිරීම සඳහා ඉදිරිපත් වෙයි.
- අදාළ වචන භාවිත කරමින් කෙටි නිවේදන ඉදිරිපත් කරයි.

නිපුණතාව 1.0 : එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින් උදව් වෙමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 1.5 : ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවලට සවන් දී රස විඳියි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- අදාළ ගීතයේ අදහස සරල බසින් ප්‍රකාශ කරයි.
- ගීතයට උචිත අයුරින් තාල තබයි.
- ගීතය ගායනා කරයි. (සාමූහික ව/තනි තනි ව)
- වෙනත් ගීත ඇසීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ ගීතය සුදුසු ක්‍රම වේදයක් භාවිත කර සියලු ම ශිෂ්‍යයන්ට ඇසීමට අවස්ථාව ලබා දෙන්න.
- ගීතය කිහිප වතාවක් ඇසීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ට ගීතය ගයන්නට අවස්ථාව ලබා දෙන්න.
- ගීතයට සවන් දීමට සලස්වා ගුරුවරයා තාල තබමින් ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය ලබා ගන්න.
- එය රස විඳිමින් (තාල තබමින්) ගායනයට අවස්ථාව ලබා දෙන්න.
- සාමූහික වශයෙන් ගායනයට යොමු කරන්න.
- කේවල ව ගායනා කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- වෙනත් ගීතයක් අසමින් තාල තබමින් ගායනය කරමින් රස විඳීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- පාඩමෙහි ඇතුළත් ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් ඃ

- මවුගුණ ගීතයක්

අම්මා අම්මා මගේ සුදු අම්මා
මගේ ම ආදර සුදු අම්මා ... //

දස මස මා ... කුසේ දරා
ලේ කිරි කරලා මට පොවලා
මා නලවා නිදි කරවා
මා ඇති දැඩි කළ සුදු අම්මා

අම්මා අම්මා මගේ සුදු අම්මා
මගේ ම ආදර සුදු අම්මා //

කවි ගී කියලා
සුරතල් කරලා
තුරුලේ හොවාලා
සෙනෙහස පාලා
මට බත් කැව්වා

අම්මා අම්මා මගෙ සුදු අම්මා
මගේ ම ආදර සුදු අම්මා //

කරුණා දයා ගුණෙන්
ඔවදන් දී ...
පාසල් යවලා
යහ මග පෙන් වන මගේ සුදු අම්මා ...

අම්මා අම්මා මගෙ සුදු අම්මා //
මගේ ම ආදර සුදු අම්මා .....

පද රචනයඃ

මුණසිංහ එම්. ගමගේ

ගුණාත්මක යෙදවුම් ඃ

- මවුගුණ ගීතය
- ගීතය ලියූ පත්‍රිකා
- ගුරුවරයා හෝ ශිෂ්‍යයෙකු ලවා ගායනය

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ගීතය තාල තබමින් රස විඳියි.
- ගීතය සාමූහික ව/තනි ව ගායනා කරයි.
- ගීත ගායනයට කැමැත්ත ප්‍රකාශ කරයි.

## කථනය - මැදිහත්වීම

නිපුණතාව 2.0: පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.1: උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

කාලච්ඡේද : 05යි

ඉගෙනුම් පල :

- උපදෙස් ලබා දීමේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- දෙන ලද උපදෙස්වලට අනුව කටයුතු කරයි.
- උපදෙස්වලට අනුව වාචික ප්‍රතිචාර දක්වයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කීප වරක් කියන්න.
- පාඩමේ අන්තර්ගතය කොටස් වශයෙන් ශිෂ්‍යයන්ට කියන්නට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍යතාව අනුව ශිෂ්‍යයන්ට සහාය වන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- පාඩමේ අන්තර්ගතය ඇතුළත් සිද්ධි හා අවස්ථා මතුකරමින් තමා සිත් ගත් එවැනි අවස්ථා ශිෂ්‍යයන්ගෙන් විමසා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උදා: (පන්ති කාමර පිරිසිදු කිරීමේ අවස්ථාවක් /පාසලේ උත්සවයකට සූදානම් වීමේ අවස්ථාවක්)

- ශිෂ්‍යයන් පාඩමෙහි ඇතුළත් ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් :

- පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක දී නිවාසයක් ගොඩ නැගීම

මේ පැත්තට

බලන්න එනවා.

හුඟක් හොඳයි.

කාටද කියලා.

ඉවර කරන්න.

පටන් ගන්නවා.

මෙයා තමයි.

නායකයා

උපනායකයා

උත්සාහය අතාරින්න එපා.

එකමුතු ව වැඩ කරන්න.

උත්සාහ කරන්නම්.

වැඩට උදව්වෙන්න.

- පුහුණුව සඳහා යොදා ගන්න.

එකමුතු ව වැඩ කරන්න.
සාමූහික ව වැඩ කරන්න.
හැමෝම වැඩ කරන්න.
වැඩට උදව් වෙන්න.
නිවාසය හදන්න උදව් වෙන්න.

හැමෝම වැඩට උදව් වෙන්න.
නිවාසය හදන්න උදව් වෙන්න.
උඩට නගින්න උදව් වෙන්න.

උත්සාහ කරන්නම්.
උදව් කරන්නම්.
වැඩ කරන්නම්.

උත්සාහය අතාරින්න එපා.
ජයග්‍රහණය අතාරින්න එපා.

දිනා ගන්න තියෙන අවස්ථාව අතාරින්න එපා.

ගුණාත්මක යෙදවුම්:

- පෙළ පොත
- මාතෘකා සහිත පත්‍රිකා

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- උපදෙස්වල දී  භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස් සහිත වචන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට මැදිහත් වී ප්‍රතිචාර දක්වයි.
- විවිධ අවස්ථාවල දී ලැබෙන උපදෙස් අනුව කටයුතු කරයි.

නිපුණතාව 2.0: පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.2: මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- මග විමසීම්වල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- එම වචන භාවිත කරමින් මග විමසීම් සිදු කරයි.
- මග විමසීම් සඳහා මැදිහත් වී කටයුතු කරයි.
- මග විමසුම්වලට අදාළ ව නිවැරදි ප්‍රතිචාර දක්වයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියන්න.
- මූලික වදන් කෙරෙහි හා පුහුණුවට දී ඇති වදන් කෙරෙහි අවධානය යොමු කරවමින් මග විමසීම් සහිත වචන හඳුනා ගැනීමට හා තේරුම් ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
- පාඩම ශිෂ්‍යයන්ට කොටස් වශයෙන් කියන්නට අවස්ථාව ලබා දෙන්න. (සාමූහික ව/තනි තනි ව)
- ශිෂ්‍යයන් දෙදෙනා බැගින් සම්බන්ධ කර ගනිමින් පන්ති කාමරයේ සජීව ඉදිරිපත් කිරීමකට යොමු කරවන්න.
- ශිෂ්‍යයන් පාඩමෙහි ඇතුළත් ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

මූලික වදන් :

- ෆාමසියක් සොයා ගැනීමට විමසා සිටීමක්

කොහේ ද?

ඕන මොනව ද?

තියෙනවා ද?

මොකක් ද?

ඉවරවෙලා

ඒකෙ බලන්න

ඔය බෙහෙත

යන්නේ කොහොම ද?

ඉස්සරහා තියෙන

- පුහුණුව  සඳහා යොදා ගන්න.

ගම කොහේ ද?
ෆාමසිය කොහේ ද?
බැංකුව කොහේ ද?

යන කොට
එන කොට
බලන කොට

එහෙ තියෙනවා ද?
මෙහෙ තියෙනවා ද?
ඒකෙ තියෙනවා ද?
මේකෙ තියෙනවා ද?

වමට හැරෙන්න.
දකුණට හැරෙන්න.
අඹ ගහ ළඟින් හැරෙන්න.
ගුරු පාර ළඟින් හැරෙන්න.

ඉස්සරහ තියෙන්නෙ මොකක් ද?
එතෙන තියෙන්නෙ මොකක් ද?

ෆාමසියක් තියෙනවා ද?
බැංකුවක් තියෙනවා ද?
තැපැල් කන්තෝරුවක් තියෙනවා ද?

ෆාමසියට යන්නෙ කොහොම ද?
බැංකුවට යන්නෙ කොහෙම ද?
කාර්යාලයට යන්නෙ කොහොම ද?

**ගුණාත්මක යෙදවුම් :**

- පෙළ පොත
- දෙබස් සහිත පත්‍රිකා
- හඬ පටයක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- යම් දෙයක් ස්ථානයක් සොයා ගැනීම සඳහා මග විමසීම් කරයි.
- අන් අයගේ විමසීම්වලට වාචික ප්‍රතිචාර දක්වයි.
- මග විමසීම් සඳහා උපකාරී වන අලුත් වචන ඉගෙනුමට යෝජනා කරයි.

නිපුණතාව 2.0 : පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.3 : සුහද සංවාදවල දී මැදිහත් වෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- සුහද සංවාදයක දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- එම වචන භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි.
- අවස්ථානුකූල ව සංවාදවලට මැදිහත් වෙයි.
- සරල සුහද සංවාදවල යෙදෙයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියන්න.
- ශිෂ්‍යයන්ට පාඩම කියන්නට අවස්ථාව සලසා දෙන්න. (සාමූහික ව/තනි තනි ව)
- සංවාදයේ භාවිත වචන ඉස්මතු කරවන්න.
- **මූලික වදන්** හා **පුහුණුව** සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- මෙම අවස්ථාව පන්ති කාමරයේ භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කරවමින් තමා අත් විඳි එවැනි සිද්ධි ශිෂ්‍යයන්ගෙන් මතු කර ගන්න.
- පාඩමට අදාළ අභ්‍යාස කරවන්න.

මූලික වදන් :

- කලින් හඳුනන මිතුරෙකු හමුවීම

ඉන්නේ කොහේ ද?

කාලෙකට පස්සේ නේද?

ඉගෙන ගන්නව ද?

අම්මලාගේ

මාරු වුණා.

කමලුත්

නුවර නේද?

ඒක නම් දන්නෙ නෑ.

හම්බ වුණ එක හොඳයි.

ආයෙත් හම්බවෙමු.

- පුහුණුව සඳහා යොදා ගන්න.

ඉන්නෙ කොහේ ද?
යන්නෙ කොහේ ද?
දුවන්නෙ කොහේ ද?
බලන්නෙ කොහේ ද?

යන එක හොඳයි.
එන එක හොඳයි.
ආව එක හොඳයි.
හම්බවුණ එක හොඳයි.

සතියකට පස්සේ නේද?
මාසයකට පස්සේ නේද?
අවුරුද්දකට පස්සේ නේද?
කාලෙකට පස්සේ නේද?

ආයෙත් හම්බවෙමු.
හෙට හම්බවෙමු.
ඉරිදට හම්බවෙමු.

ගුණාත්මක යෙදවුම්ः

- ගුරු සිසු කතාබහක්
- පෙළ පොත

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- සුහද සංවාදවල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සංවාදවලට ඉදිරිපත් වෙයි.
- සංවාදවලට මැදිහත් වී ප්‍රකාශන කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සුහද සංවාදවල නිරත වෙයි.

නිපුණතාව 2.0 : පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.4 : තොරතුරු හුවමාරු කර ගැනීමේ දී මැදිහත් වෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- අවස්ථානුකූල ව තොරතුරු හුවමාරුවේ දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- එම වචන භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි.
- තොරතුරු විමසමින් මැදිහත් වෙමින් එකඟතාවකින් කටයුතු කරයි.
- විවිධ අවස්ථාවල දී තොරතුරු හුවමාරු කර ගනියි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම සියලු ම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.
- ශිෂ්‍යයන්ට පාඩම කියවන්නට අවස්ථාව සලසා දෙන්න. (සාමූහික ව/තනි තනි ව)
- **මූලික වදන්වල** ඇති සංවාද, පද රටා හා සුහද කතාබස්වල දී භාවිත වචන ඉස්මතු කරවන්න.
- පාඩම පන්ති කාමරයේ සජීව අවස්ථාවක් බවට පත් කර ගනිමින් තොරතුරු හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- තමා අත් විඳි එවැනි සිද්ධියක් ඇසුරෙන් අනෙක් ශිෂ්‍යයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීමට අවශ්‍ය පරිසරය ගොඩනගන්න.

මූලික වදන් :

- වැසි වසින දවසක ළමයින් අතර ඇති වන කතාබහක්

| | |
|---|---|
| මෙතන | තෙමුණා. |
| උදෙන් ම | වැස්ස හින්දා |
| විදුලි කොටනවා. | ඒක හින්දා |
| ගොරවනවා. | ඉහලා ගෙන |
| ටික වේලාවක් | තව ම නැහැනේ |
| කොහොමද එන්නේ? | කවුද අර එන්නේ? |
| හොඳට ම තෙමිලා. | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

1. වැස්ස වහිනවා.
   උදෙන් ම වහිනවා.
   දවස ම වහිනවා.
   නිතර ම වහිනවා.

2. ටිකක් තෙමිලා.
   හුඟක් තෙමිලා.
   ගොඩක් තෙමිලා.
   හොඳට ම තෙමිලා.

3. කවුද එන්නෙ?
   කොහොමද එන්නෙ?
   කවදා ද එන්නෙ?
   කොහාට ද එන්නෙ?

ගුණාත්මක යෙදවුම් :

- ගුරු සිසු කතාබහක්
- පෙළ පොත

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- තොරතුරු විමසීමේ දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තොරතුරු විමසීමට මැදිහත් වෙයි.
- අදහස් හුවමාරු කර ගැනීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- එකිනෙකා අතර තොරතුරු හුවමාරු කර ගනියි.

නිපුණතාව 2.0 : පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.5: ගනුදෙනුවල දී මැදිහත් වෙයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- ගනුදෙනුවල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- එම වචන භාවිත කරමින් ගනුදෙනුවල යෙදෙයි.
- විවිධ ගනුදෙනු සිදු කරයි.
- විවිධ ගනුදෙනුවල දී සුහද ව අදහස් ප්‍රකාශ කිරීමට මැදිහත් වෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම සියලු ම ශිෂ්‍යයන්ට ඇසීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ට පාඩම කොටස් වශයෙන් කියවන්නට අවස්ථාව සලසා දෙන්න. (සාමූහික ව/තනි තනි ව)
- **මූලික වදවන්වල** හා **පුහුණුව** සඳහා ලබා දී ඇති ගනුදෙනුවල දී භාවිත වන වචන ශිෂ්‍යයන් ලවා ඉස්මතු කරවන්න.
- එම වචන භාවිත කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- අදහස් හුවමාරු කර ගැනීමේ කුසලතාව ප්‍රදර්ශනය කරවන්න.
- ශිෂ්‍යයන්ට තම අත්දැකීම් පාදක කර ගනිමින් එවැනි ගනුදෙනුවලට මැදිහත් වූ අවස්ථාවක් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උදා:

- සත්තු වත්ත නැරඹීමට යාම
- වරාය නැරඹීමට යාම

- පාඩමේ අභ්‍යාස ශිෂ්‍යයන් ලවා කරවන්න.

මූලික වදන් :

- යම් ස්ථානයක් නැරඹීමට ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම

| | |
|---|---|
| බලන්න යමු. | ගන්න ඕන නේද? |
| කවද ද? | ගන්නෙ කොහෙන් ද? |
| සිකුරාදාට බෑ. | කීයට ද? |
| වහලා | ළමයෙකුට |
| සෙනසුරාදා යමු. | ලොකු අයෙකුට |
| කොහොම හරි | කොහෙන් හරි |
| ගන්න ඕන. | එහෙනම් |
| එහෙනං | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

ටිකට් ගන්නේ කොහෙන් ද?

ටිකට් ගන්නේ කාගෙන් ද?
ටිකට් ගන්නේ කවද ද?

එන්න ඕන නේද?
යන්න ඕන නේද?
ගන්න ඕන නේද?
කියන්න ඕන නේද?

ටිකට් එකක් කීය ද?
ළමයෙකුට කීය ද?
ලොකු අයෙකුට කිය ද?

පටන් ගන්නේ කියට ද?
අවසන් කරන්නේ කීයට ද?
ඉරිදට බෑ.
සඳුදට බෑ.
හෙට බෑ.
අනිද්දට බෑ.

ගුණාත්මක යෙදවුම් :

- දුරකථන සංවාදයක්
  (තෝරාගත් ළමුන් දෙදෙනෙකු)
- සංවාද ඇතුළත් පත්‍රිකා
- පෙළ පොත

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ගනුදෙනුවලට අදාළ ව භාවිත වචන ප්‍රකාශ කරයි.
- ගනුදෙනුවලට මැදිහත් වී කටයුතු කරයි.
- විවිධ ගනුදෙනුවල දී සුහද ව අදහස් ප්‍රකාශ කරයි.

නිපුණතාව 2.0: පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.6: සාකච්ඡාවල දී මැදිහත් වෙයි.

කාලච්ඡේද : 04යි

ඉගෙනුම් පල :

- සාකච්ඡාවල දී උචිත වචන යොදමින් කතා කරයි.
- අන්‍යයන්ගේ මත ඉවසමින් සාකච්ඡාවට මැදිහත් වෙයි.
- තම අදහස් සරල ව ප්‍රකාශ කරයි.
- විවිධ සාකච්ඡාවල දී අවස්ථානුකූල ව වචන හසුරුවමින් සහභාගි වෙයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම ශිෂ්‍යයන්ට කියවන්න අවස්ථාව සලසා දෙන්න. (සාමූහික ව - තනි තනි ව)
- සාකච්ඡාවල දී භාවිත වන පද රටා කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- ශිෂ්‍යයන් දෙදෙනා බැගින් යොදා ගනිමින් මෙම සාකච්ඡාව ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- **මූලික වදන් හා පුහුණුව** සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.

මූලික වදන් :

- නිවේදන කටයුතු කිරීම සඳහා ශිෂ්‍යයෙක් තෝරා ගත් අවස්ථාවක්

| | |
|---|---|
| ගිය සුමානෙ | ළමා වැඩසටහන |
| තේරුණාලු නේද? | තරගය |
| අවස්ථාවක් ලැබිලා. | සුබ පතනවා. |
| තියෙනවා. | ළමා නිවේදිකාව |
| බලන්න පුළුවන් | කොළඹ |
| කටහඬ පරීක්ෂණයක් තියෙනවා. | |
| යන්න වෙලා | |
| පාසලටත් ආඩම්බරයක්නේ | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

| | |
|---|---|
| ගිය සුමානේ | ගෙදර යන්න වෙලා තියෙනවා. |
| ගිය මාසේ | පාසලට යන්න වෙලා තියෙනවා. |
| ගිය අවුරුද්දේ | කොළඹ යන්න වෙලා තියෙනවා. |
| | යාපනේ යන්න වෙලා තියෙනවා. |

| | |
|---|---|
| තේරුණා ලු | ඔයා තරගෙට තේරුණා ලු |
| ලැබුණා ලු | සුරේෂ් කොළඹ යනවා ලු |
| යනවා ලු | නිවේදනය කරන්න අවස්ථාව ලැබුණා ලු |
| ගියා ලු | සමන් යාපනේ ගියා ලු |
| තියෙනවා ලු | යාපනේ මිදි තියෙනවා ලු |

ඔයාට සුබ පතනවා.

ඔයාට ජයවේවා! කියලා පතනවා.

ගුණාත්මක යෙදවුම් :

- නිවේදනයක් (පන්තියට කාමරය තුළ)
- විවිධ මාතෘකා යටතේ නිවේදන කීපයක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- සරල සාකච්ඡාවල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සාකච්ඡා ආරම්භ කරමින් පවත්වා ගෙන යයි.
- සුහදතාව වර්ධනය කර ගනිමින් සාකච්ඡාවල යෙදෙයි.
- විවිධ සාකච්ඡාවලට මැදිහත් වීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

නිපුණතාව 2.0 : පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

නිපුණතා මට්ටම 2.7: වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- වාචික ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ස්වභාවය හඳුනා ගෙන අනුගමනය කරයි.
- වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.
- ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.
- විවිධ උපකරණ/ආධාරක භාවිත කරමින් වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම ශිෂ්‍යයින්ට කියවීමට අවස්ථාව දෙන්න. (සාමුහික ව/තනි තනි ව)
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- වාචික ඉදිරිපත් කිරීම් සඳහා ශිෂ්‍යයන්ට අවස්ථාව ලබාදෙන්න.
- පහත සඳහන් මාතෘකාව යටතේ ප්‍රශ්න අසමින් පිළිතුරු දෙමින් අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
  උදා: මිතුරු පාසල් හමුවේ වැදගත්කම (ඉතා සරල අදහස් කීපයක්)
- පාඩමේ අභ්‍යාස කරවන්න.

මූලික වදන් :

- භාෂා ඉගෙන ගැනීමේ වැදගත්කම

| | |
|---|---|
| මම | දෙක ම |
| මගේ | ඉගෙන ගන්න ඕන. |
| ඒක හින්දා | ආශ්‍රය කරන්න ඕන. |
| හොඳට කතා කරනවා. | කතා කරන්නත් පුළුවන් |
| ඉගෙන ගන්නවා. | ඉගෙන ගන්න පුළුවන් |
| ඒවා හොඳට බෑ. | ටිකක් පුළුවන් |

- පුහුණුව සඳහා යොදා ගන්න.

| | |
|---|---|
| ඉගෙන ගන්න ඕන. | ටිකක් පුළුවන් |
| ආශ්‍රය කරන්න ඕන. | ගොඩක් පුළුවන් |
| ඉඩ දෙන්න ඕන. | හුඟක් පුළුවන් |
| අහන්න ඕන. | |
| යන්න එපා. | සිංහල පුළුවන් |
| එන්න එපා. | දෙමළ පුළුවන් |
| අඬන්න එපා. | කතා කරන්න පුළුවන් |
| දුවන්න එපා. | ඉගෙන ගන්න පුළුවන් |

ගුණාත්මක යෙදවුම්:

- භාෂාවේ වැදගත්කම පිළිබඳ ව ලියවුණු කුඩා ලිපියක්
- විවිධ මාතෘකා යටතේ ලියූ ලිපි

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- අසන ලද ප්‍රශ්නවලට නිවැරදි ව සරල වාචික පිළිතුරු සපයයි.
- ප්‍රශ්න අසමින් පිළිතුරු දෙමින් වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.
- විවිධ මාතෘකා යටතේ වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

# කියවීම

නිපුණතාව 3.0 : එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැ සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වයි. ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 3.1 : ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ලිපියක් නිශ්ශබ්ද ව කියවයි.
- එම ලිපියේ ඇතුළත් තොරතුරු කියයි.
- වෙනත් ලිපි ලේඛන කියවයි නරඹයි.
- ඒවායේ සරල අදහස් ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය :

- පෙළ පොතෙහි නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරා ගන්න.
- පාඩමෙහි ඇතුළත් ලිපිය කිහිප වරක් කියවන්න.
- ලිපියේ ඇතුළත් විරාම ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරවන්න.
- ලිපියෙන් කියවෙන සරල අදහස ඉස්මතු කරවන්න.
- තමාට ලැබුණු ලිපියක් අවබෝධයෙන් කියවීමට හැකි වන අයුරෙන් ශිෂ්‍යයන්ගේ හැකියා සංවර්ධනය කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්වල යෙදීමට සහාය වන්න.

මූලික වදන් :

- යහළුවෙකුගෙන් ලැබුණු ලිපියක්

| | |
|---|---|
| එනවා. | නොහැකි වීම |
| ආවොත් | ලියන්නේ |
| කොහෙන් ද? | ඔයාලගෙ |
| ගියත් | කීවා. |
| ආවානම් | කන කොට |
| ලැබෙයි ද? | කන විට |
| කලින් කියලත් | ඒ වෙලාවෙ දී |
| එන විට (එන කොට) | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

මම එනකොට

අපි එනකොට

ඔහු එනකොට

සුරේෂ් එනකොට

තාත්තා ආවොත් හොඳයි.

අයියා ආවොත් හොඳයි.

කමල් ආවොත් හොඳයි.

ඔයා ආවොත් හොඳයි.

බලන්න ලැබෙයි ද?

කියන්න ලැබෙයි ද?

අහන්න ලැබෙයි ද?

යන්න ලැබෙයි ද?

* භාෂණයේ දී බහුල වශයෙන් 'කොට' යන්න යොදනු ලැබේ. එහෙත් ලේඛනයේ දී බහුල ව යෙදෙන්නේ 'විට' යන රූපයයි.

ගුණාත්මක යෙදවුම් :

- මිතුරෙකුට ලියූ ලිපියක්
- පෙළ පොතේ පාඩම

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ලිපියක ආකෘතිය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සරල වාක්‍ය ඇතුළත් ලිපි නිවැරදි ව කියවයි.
- ලිපියක සරල අදහස ප්‍රකාශ කරයි.
- පින්තූර/චිත්‍ර ආදිය බලා ඒවාට අදාළ වාක්‍ය කියවයි.
- වෙනත් ලිපි ලේඛන/පින්තූර කියවීමට හා නැරඹීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

නිපුණතාව 3.0 : එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වයි. ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 3.2 : සාහිත්‍යමය පාඨ කියවයි. නරඹයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ගීතයට අනුව තාල තබයි.
- ගීතය ගායනා කරයි.
- පින්තූර නරඹමින් ගීතයේ සරල අර්ථය ප්‍රකාශ කරයි.
- ගීතය තාලානුකූල ව ගායනා කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතාවට අදාළ පාඩම හා ක්‍රියාකාරකම් තෝරාගන්න.
- ගුරුවරයා හෝ සම්පත් පුද්ගලයෙකු යොදා ගනිමින් අදාළ ගීතය ගායනා කරන්න.
- සියලු ම ශිෂ්‍යයන්ට ගීතය ගායනා කරන්න අවස්ථාව ලබා දෙන්න. (තනි තනි ව/ සාමූහික ව)
- පින්තූර නරඹමින් ගීතයේ තම සිත් ගත් තැන් ඉස්මතු කර දක්වන්නට සහාය වන්න.
- ශිෂ්‍යයන් අසා ඇති ගීත පිළිබඳ විමසන්න. ඔවුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම් කරවන්න.

මූලික වදන් :

- ගීතයක්

සීත සුළං දසත හමන්නේ

සුදු වලාකුළයි කන්දෙ හැපෙන්නේ

නුවර එළියෙ යන්නේ

පොඩි විවේකයක් ගන්නේ

ගතේ සිතේ සුවය දැනෙන්නේ

- පුහුණුව සඳහා යොදා ගන්න.

කොළඹ යන්නේ

ගෙදර යන්නේ

පාසල් යන්නේ

මල්වත්ත බලන්නේ

දිය ඇලි බලන්නේ

පාර බලන්නේ

සුළඟ හමන්නේ

සුවඳ හමන්නේ

සුවය දැනෙන්නේ

සතුට දැනෙන්නේ

ගුණාත්මක යෙදවුම් :

- පෙළ පොතේ පාඩම
- පෙර සූදානම් කර ගත් සිසුන් ලවා ගයන ගීතයක්
- හඬ පටයක් යෙදා ගැනීම

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ගීතය ගායනා කරයි.
- ගීතයේ සරල අදහස් තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- ගීතය ගායනා කරමින් රස විඳියි/පින්තූර නරඹයි.
- වෙනත් ගීත ගායනයට කැමැත්ත ප්‍රකාශ කරයි.

නිපුණතා 3.0 : එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 3.3 : උපදෙස් කියවයි. නරඹයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- උපදෙස්වල ඇතුළත් වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- වෙනත් සරල උපදෙස් කියවයි.
- උපදෙස් අනුව කටයුතු කරයි.
- එදිනෙදා ජීවිතයේ දී විවිධ අවස්ථාවල භාවිත උපදෙස් කියවයි/නරඹයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- පෙළ පොතේ නිපුණතා මට්ටමට අදාළ පාඩම හා ඊට අදාළ ක්‍රියාකාරකම් සියල්ල තෝරා ගන්න.
- පෙළ පොතේ අදාළ පාඩම කියවමින් ආදර්ශනය කරන්න.
- ශිෂ්‍යයන් ලවා පාඩම කියවන්න.
- චාරිකාවක දී ලැබෙන උපදෙස් හා භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කිරීමේ දී යොදන වචන ශිෂ්‍යයන්ට හඳුනා ගැනීමට සලස්වන්න.
- උපදෙස් කියවා ඒ අනුව ක්‍රියා කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- පාඩමෙහි ඇතුළත් ක්‍රියාකාරකම් කරවන්න.

මූලික වදන් :

- චාරිකාවක දී භික්ෂූන්ට උපස්ථාන කිරීම

| | |
|---|---|
| හාමුදුරුවෝ (භික්ෂූන් වහන්සේ) | හීල් දායනයට |
| හාමුදුරුවරු දෙනමක් | දාන ශාලාව |
| උන්වහන්සේලාගේ දානය | පිළිගන්වන්න. |
| පැන් පහසුවන්න | වඩින්න. |
| උන්වහන්සේලාට | වළඳන්න. |

• පුහුණුව සඳහා යොදා ගන්න.

| | | |
|---|---|---|
| නමක් | - | හාමුදුරු නමක් |
| දෙනමක් | - | හාමුදුරුවරු දෙනමක් |
| තුන් නමක් | - | හාමුදුරුවරු තුන් නමක් |
| හතර නමක් | - | හාමුදුරුවරු හතර නමක් |

හාමුදුරුවෝ
- වළඳනවා.
- වඩිනවා.
- අමදිනවා.
- සැතපෙනවා.

දානය

පැන්

ගිලන්පස

හාමුදුරුවෝ වැඩ ඉන්නවා.

හාමුදුරුවෝ දානෙ වළඳනවා.

හාමුදුරුවෝ පැන් වළඳනවා.

හාමුදුරුවන්ට දානය පිළිගන්වන්න.

හාමුදුරුවන්ට ගිලන්පස පිළිගන්වන්න.

හාමුදුරුවන්ට පැන් පිළිගන්වන්න.

ගුණාත්මක යෙදවුම් :

- පෙළ පොතේ පාඩම
- භික්ෂූන් වහන්සේලා හා බැඳුණු විශේෂිත වචන ඇතුළත් පත්‍රිකාවක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- සුවිශේෂ අවස්ථාවල භාවිත උපදෙස් සහිත වචන හඳුනා ගෙන කියවයි.
- සුවිශේෂ උපදෙස්වල අදහස සරල බසින් ප්‍රකාශ කරයි.
- සුවිශේෂ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව පිළිගනියි.
- උපදෙස්වලට අනුව කටයුතු කරයි.
- වෙනත් උපදෙස් සහිත පත්‍රිකා කියවයි.

නිපුණතාව 3.0 : එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

නිපුණතා මට්ටම 3.4: ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ **(Audio visual text)** හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි.
- පින්තූර කතාවක එක් එක් අවස්ථාවල දැක්වෙන විස්තරය කියවයි/නරඹයි.
- සරල කතාවක් පිළිවෙළින් ගොඩ නගා කියවයි.
- රසවත් කෙටි සිද්ධි ඇතුළත් කතා කියවයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම හා අභ්‍යාස තෝරා ගන්න.
- පින්තූර කතාව බලා එහි ඇති පාඨ කියවීමට/අවස්ථාව ලබා දෙන්න.
- පාඩම කියවා ආදර්ශනය කරන්න.
- එහි ඇති පින්තූර කතාව ශිෂ්‍යයන්ට බලා කියවන්නට අවස්ථාව සලසන්න.
- සියලු ම ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කරවන්න.

**විෂය අන්තර්ගතය** :

- පින්තූර කතාවක් (movie)

වලහා කී රහස

දෙන්නෙක්
ගොඩක්
නොයෙක්
දුර යනකොට
උඩට නැග්ගා

නගින්න බෑ.
උදව් කළේ නෑ.
කිට්ටුවට එනකොට
ඇවිදලා යන්න.
කියලා ඇහුවා.
එපා කියලා

- පුහුණුව සඳහා යොදා ගන්න.

මම පාසල් යනකොට
අම්මා පොළට යනකොට
අයියා නාන්න යනකොට
ඔයා ගෙදර යනකොට

නංගී සෙල්ලම් කරනකොට
තාත්තා වැඩ කරනකොට

මට දුවන්න බෑ.
සුරේෂ්ට දුවන්න බෑ.
හිමාලිට දුවන්න බෑ.

නංගිට ගස් නගින්න බෑ.
සමන්ට උඩට නගින්න බෑ.

ගුණාත්මක යෙදවුම් :

- පැරණි ජනකතාවක් සහිත ශ්‍රව්‍ය දෘශ්‍ය පටයක්
- කතාවට අදාළ ව සැකසුණු පින්තූර පෙළක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- පින්තූර කතාවට අදාළ පාඨ කියවයි.
- පින්තූර කතාවේ සරල අදහස තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- පින්තූර ගළපා කතාව ගොඩනගා කියවයි.
- පින්තූර කතාවෙන් යහපත් ආදර්ශයක් දෙන බව පිළිගනියි/ප්‍රකාශ කරයි.
- පින්තූර කතා නරඹමින් කියවීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

## ලිවීම

නිපුණතාව 4.0 : පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

නිපුණතා මට්ටම 4.1 : විස්තර පාඨ ලියයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- මාතෘකාවක් යටතේ කෙටි වාක්‍ය කිහිපයක් ලියයි.
- වාක්‍ය ලිවීමේ දී විවිධ පද රටා අනුව වාක්‍ය ලියයි.
- තම අත්දැකීමක් සරල බසින් ලියයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- පෙළ පොතේ අදාළ පාඩම තෝරා ගන්න.
- පාඩමට අදාළ සිද්ධිය තම අදහසින් ලිවීමට උපදෙස් දෙන්න.
- තම අත්දැකීමක් කෙටි සරල වාක්‍ය මගින් ලිවීමට හුරු කරවන්න.
- පෝස්ටර්, ප්‍රදර්ශන පුවරු යොදා ගනිමින් ශිෂ්‍යයන්ට සරල ව තේරුම් ගෙන ඒ ඇසුරෙන් වාක්‍ය ලිවීමට හුරු කරවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- සියලු ම ක්‍රියාකාරකම් හා අභ්‍යාස කරවන්න.

මූලික වදන් :

- අකුරු කියවීමේ අවස්ථාවක්

පිසන්නීය.
සිටියි/සිටින්නේය.
ගෙනෙයි/ගෙනෙන්නීය.
හොඳ දවසක්
කිරිබත් උයනවා.
අම්මයි තාත්තයි
මල්ලියි මමයි
හාමුදුරුවෝ හමුවෙනවා.
කියවනවා.

- පුහුණුව සඳහා යොදා ගන්න.

| | | |
|---|---|---|
| කියනවා | කියයි | කියති |
| බලනවා | බලයි | බලති |
| කරනවා | කරයි | කරති |
| දුවනවා | දුවයි | දුවති |

තාත්තා පොතක් ගෙනෙයි / ගෙනෙන්නේ ය.

අම්මා කිරිබත් පිසයි/පිසන්නීය.

අක්කා මල් කඩයි/කඩන්නීය.

අම්මයි තාත්තයි එනවා.

අයියයි අක්කයි දුවනවා.

මල්ලියි නංගියි නටනවා.

නැන්දයි මාමයි බලනවා.

ආච්චියි සීයයි යනවා.

ගුණාත්මක යෙදවුම් :

- කථන බසින් ලියූ වාක්‍ය කිහිපයක් (ලිඛිත බසට හැරවීමට)
- පෙළ පොත

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- පාඩමට අදාළ සිද්ධිය සරල වාක්‍යවලින් ලියයි.
- තම අත්දැකීමක් සරල ව ලියා දක්වයි.
- වාක්‍ය නිර්මාණය සඳහා කැමැත්ත පළ කරයි.

නිපුණතාව 4.0 : පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

නිපුණතා මට්ටම 4.2 : නිර්මාණාත්මක පාඨ ලියයි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- සිදුවීමක් ඇසුරින් නිර්මාණාත්මක වාක්‍ය කිහිපයක් ලියයි.
- තම අත්දැකීමක් නිර්මාණාත්මක ව ලියයි.
- කාල්පනික අවස්ථාවක් මාතෘකා කර ගනිමින් නිර්මාණාත්මක පාඨ ලියයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම තෝරාගන්න.
- පළමු ව නිර්මාණාත්මක ව පාඨ කිහිපයක් ලියා ආදර්ශනය කරන්න.
- විවිධ අවස්ථා මාතෘකා කර ගනිමින් නිර්මාණාත්මක ව පාඨ කිහිපයක් ලිවීමට හුරු කරවන්න.
- ශිෂ්‍යයන් ද නිර්මාණකරණයට පොලඹවන්න.

මූලික වදන් :

- තාත්තාට රැකියා ස්ථානයේ මාරුවක් ලැබී අලුත් පාසලකට යාමට සිදුවීම.

  ලියුමක් ලැබුණා.

  මාරු කරලා.

  ගොඩක් කැමතියි.

  හුඟක් කැමතියි.

  හුඟක් යාළුවො ඉන්නවා.

  වෙන්වෙලා යනකොට

  ඇතිවෙනවා.

  හමුවේවි.

  මතක් වේවි.

- පුහුණුව සඳහා යොදා ගන්න.

හුගක් යාළුවො ඉන්නවා.

හුගක් නෑයො ඉන්නවා.

හුගක් පුත්තු ඉන්නවා.

හුගක් මාළු ඉන්නවා.

හමු වේවි.

එකතු වේවි.

මතක් වේවි.

යාළුවො හමු වේවි.

යාළුවො එකතු වේවි.

යාළුවො මතක් වේවි.

ගුණාත්මක යෙදවුම් ඃ

- විවිධ සිදුවීම් ඇගත් රූප පෙළක්
- පෙළ පොත

තක්සේරුව හා ඇගයීම ඃ

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- මාතෘකාවට අදාළ ව නිර්මාණාත්මක වාක්‍ය ලියයි.
- විවිධ මාතෘකාවලට අනුව වාක්‍ය නිර්මාණය කිරීමට කැමැත්ත පළ කරයි.
- තම සිත් ගත් අවස්ථාවක් පිළිබඳ නිර්මාණාත්මක වාක්‍ය ලියයි.

නිපුණතාව 4.0 : පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

නිපුණතා මට්ටම 4.3 : ලිපි ලියයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- වෙනස්කම් සහිත විධිමත් හා අවිධිමත් සරල ලිපි ලියයි.
- විධිමත් ලිපි ලිවීමට හුරු වෙයි.
- තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලිපි ලියයි.
- රාජකාරිමය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලිපි ලියයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- නිපුණතාවට අදාළ පාඩම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව සලසා දෙන්න.
- ලිපියේ අන්තර්ගතයේ ඇති වචන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට යොමු කරන්න.
- ලිපියක මූලික කොටස් හඳුනා ගැනීමට සහාය වන්න. (ආකෘතියක් ඉදිරිපත් කරන්න.)
- තම අවශ්‍යතා පාදක කර ගනිමින් ලිපි ලිවීමේ හුරුව ඇති කරවන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම් හා අභ්‍යාස කරවන්න.

මූලික වදන් :

- පාඨමාලාවක් හැදෑරීම සඳහා අයදුම් පතක් ලබා ගැනීම

අයදුම් කිරිම සඳහා

අයදුම් පත්‍රයක්

කරුණාවෙන්

ඉල්ලා සිටිමි.

ඇල වූ

ලියූ

- පුහුණුව සඳහා යොදා ගන්න.

අයදුම් පත්‍රයක්

ආකෘති පත්‍රයක්

අත් පත්‍රිකාවක්

ඇල වූ

ලියූ

වැසූ

කැපූ

මුද්දර ඇල වූ ලියුම් කවරයක්

යාලුවාට ලියූ ලියුමක්

දොර වැසූ කඩයක්

කැපූ කොස් ගෙඩියක්

ගුණාත්මක යෙදවුම් :

- රාජකාරි මට්ටමින් සැකසූ ලිපි කිහිපයක්
- විවිධ අවස්ථා සඳහන් (මාතෘකා) කිහිපයක්
- විධිමත් ලිපි ලිවීමේ ආකෘතිය ලියූ පත්‍රිකාවක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- විවිධ වර්ගයේ ලිපි කියවයි.
- ලිපි ලිවීමේ දී භාවිත වන විශේෂ වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විධිමත් ලිපියක විශේෂ ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- දෙන ලද අවස්ථාවක් පදනම් කර ගෙන නිවැරදි ව විධිමත් ලිපියක් ලියයි.
- ලිපි ලිවීමට හා කියවීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

නිපුණතාව 4.0 : පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

නිපුණතා මට්ටම 4.4: තොරතුරු සහිත පාඨ ලියයි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- තොරතුරු ඇතුළත් පාඨ හඳුනා ගෙන ලියයි.
- සරල මාතෘකා යටතේ තොරතුරු ඇතුළත් පාඨ ලියයි.
- සිත් ගත් අවස්ථාවක් පිළිබඳ තොරතුරු පාඨ ලියයි.
- පුවත් පතකට ලිපියක් ලියයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව සලසා දෙන්න.
- පාඩමේ අන්තර්ගතයේ ඇති වචන සහ තොරතුරු ශිෂ්‍යයන්ට හඳුනා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
- සමස්ත පාඩම අවබෝධ කර ගැනීමට සහාය වන්න.
- එවැනි සිද්ධියක් මාතෘකා කර ගනිමින් විවිධ තොරතුරු පාඨ ඇතුළත් වාක්‍ය ගොඩනගා ලිවීමට අවස්ථාව සලසා දෙන්න.
- පහත මාතෘකා යටතේ සරල තොරතුරු පාඨ ලිවීමට යොමු කරවන්න.
  - පාසල් වත්ත පිරිසිදු කිරීම.
  - වන සම්පත සුරැකීම.
  - ඩෙංගු රෝගය දුරලමු.
  - පාසල් බස් රථයක් ලබා ගැනීම.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම් අභ්‍යාස කරවන්න.

මූලික වදන් :

- සුන්දර දිය ඇළි

| | |
|---|---|
| මීදුම | රැසක් |
| දියඇලි | කඳුරට |
| වතුර | ලැබෙනවා. |
| සීතල | ඒ වුණත් |
| සුන්දර | එක්වෙනවා. |
| | කරනවා නම් |
| | ලබාගන්න පුළුවන් |
| | එහෙම වුණොත් |
| | කරන්නත් පුළුවන් |

- පුහුණුව සඳහා යොදා ගන්න.

සෙල්ලම් කරනවා නම් එන්න.
මීදුම බලනවා නම් එන්න.
නාන්න යනවා නම් එන්න.
නුවර එළියේ යනවා නම් කෝච්චියෙන් එන්න.

දිය ඇළි බලන්න ලැබෙනවා.
මල් වත්ත බලන්න ලැබෙනවා.
කඳු බලන්න ලැබෙනවා.
මීදුම බලන්න ලැබෙනවා.

සතුටු වෙන්න පුළුවන්.
සෙල්ලම් කරන්න පුළුවන්.
පීනන්න පුළුවන්.

ගුණාත්මක යෙදවුම් :

- පෙළ පොතේ පාඩම
- විවිධ ස්ථානවල පින්තූර

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- දෙන ලද විස්තරවලට අදාළ ව තොරතුරු පාඨ ලියයි.
- බිත්ති පුවත් පතකට/සඟරාවකට තොරතුරු පාඨ ලියයි.
- පාසලේ පවත්නා තත්ත්වයක් පිළිබඳ විස්තරයක් ලිවීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

නිපුණතාව 4.0: පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

නිපුණතා මට්ටම 4.5: ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- අයදුම්පතට අදාළ ව තොරතුරු කෙටියෙන් ඉදිරිපත් කරයි.
- අයදුම්පතක් පුරවයි.
- පාඨමාලාවක් හැදෑරීම/රැකියාවක් සඳහා අයදුම් පත්‍රයක් සම්පූර්ණ කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස් :

- නිපුණතා මට්ටමට අදාළ පාඩම කියවා අවබෝධකර ගැනීමට අවස්ථාව සලසා දෙන්න.
- විස්තරයක් ඇසුරෙන් අයදුම්පතක් සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- විවිධ ආකෘති පත්‍ර පිරවීමට ශිෂ්‍යයන්ට අවස්ථා ලබා දෙන්න
  උදා :**සීසන් ලබාගැනීම, පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම, බැංකු ආකෘති පත්‍ර පිරවීම**
- මූලික වදන්හි ඇති ආකෘති පත්‍රය ද භාවිතයට ගන්න.
- පාඩමෙහි ඇතුළත් අභ්‍යාස හා ක්‍රියාකාරකම් කරවන්න.

මූලික වදන් :

- පාඨමාලාවක් හැදෑරීම සඳහා අයදුම් පත්‍රයක් පිරවීම

  සම්පූර්ණ නම :

  මුලකුරු සමග නම :

  තැපැල් ලිපිනය :

  දිස්ත්‍රික්කය :

  පළාත :

  උපන් දිනය :

  වයස :

  අවුරුදු: ........මාසː ........දිනː........

  ස්ත්‍රී/පුරුෂභාවය :

  අධ්‍යාපන සුදුසුකම් :

  විෂය :

  දිනය :

  අත්සන

ගුණාත්මක යෙදවුම් :

- විවිධ ආකෘති පත්‍ර (පාඨමාලා ඉල්ලුම් පත්‍ර  විභාග ඉල්ලුම් පත්‍ර)
- පෙළ පොත
- පුවත් පතකින් උපුටා ගත් ඇබෑර්තුවක්

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමේ දී භාවිත  වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- විස්තරාත්මක ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමේ හුරුව පෙන්නුම් කරයි.
- වෙනත් විස්තරාත්මක ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරයි.
- විවිධ වර්ගවල ආකෘති පත්‍ර සොයා සම්පූර්ණ කරයි.
- ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට තමන්ට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.